TRADE
(Part-VII)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

විද්‍යුත් ව්‍යාපාර

වෙළෙඳ කටයුතුවලට අමතර ව නිෂ්පාදන, අලෙවිකරණ, ගිණුම්කරණ, මානව සම්පත්, කළමනාකරණ කටයුතු ආදී සියලු ම අභ්‍යන්තර ක්‍රියාවලීන් පරිගණක ජාල භාවිත කරමින් සිදු කරන ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

විද්‍යුත් ව්‍යාපාරයක පවතින අංශ අතර සිදු වන තොරතුරු හුවමාරුව සහ සමායෝජන කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරයි.

ClassWork.LK

විද්‍යුත් වාණිජ්‍ය

විද්‍යුත් වාණිජ්‍ය යනු විද්‍යුත් ව්‍යාපාරවල එක් කොටසක් පමණි. එනම් වෙළෙඳ කටයුතු හා වෙළෙඳාම සඳහා සහාය වන ප්‍රවාහන, සන්නිවේදන, බැංකු වැනි උපකාරක සේවා කටයුතු ද විද්‍යුත් ජාල ඔස්සේ සිදු කිරීමයි.



ClassWork.LK

විද්‍යුත් වෙළෙඳාම

විද්‍යුත් වෙළෙඳාම යනු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම හා විකිණීමේ කටයුතු අන්තර්ජාලය ප්‍රමුඛ පරිගණක ගත තොරතුරු පද්ධති හරහා සිදු කිරීමයි.

විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය

- අන්තර්ජාලය ඔස්සේ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම
- වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම
- භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදු වීම
- ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම

ClassWork.LK

විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයාට, ගනුදෙනුකරුවාට හා සමාජයීය වශයෙන් ලැබෙන වාසි

ව්‍යාපාරිකයාට ලැබෙන වාසි

- වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දිය හැකි නිසා කීර්තිනාමය හා ලාභය වැඩි වීම

- පිරිවැය වාසි අත්වීම

  නිදසුන් :
  තොග සම්බන්ධ පිරිවැය අවම වීම
  ලිපි ද්‍රව්‍ය හා සන්නිවේදනය සඳහා පිරිවැය අවම වීම
  අතරමැදියන් අවම වීම නිසා පිරිවැය අවම වීම

- භූගෝලීය සීමා නො මැති වීම නිසා වෙළෙඳපොළ පුළුල් වීම

ClassWork.LK

පාරිභෝගිකයාට ලැබෙන වාසි

- භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
- පහසුවෙන් හා ඉක්මණින් ඇණවුම් කළ හැකි වීම
- දවසේ පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
- නිෂ්පාදිතයේ මිල මට්ටම සාපේක්ෂව අඩු වීම

සමාජයීය වශයෙන් ලැබෙන වාසි

- පාරිභෝගිකයින්ගේ ජීවන තත්වය ඉහළ යාම
- නව භාණ්ඩ පරිහරණයට ඉඩකඩ සැලසීම
- නව වෙළෙඳපොළවල්, සහ රැකියා අවස්ථා උදා වීම

ClassWork.LK

විද්‍යුත් වෙළෙඳාමේ සීමා

- අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයක ම ව්‍යාප්ත නොවීම

- භාවිතය පිළිබඳ ව පාරිභෝගිකයින්ගේ දැනුම මදිකම

- ගෙවීම් ක්‍රමවල පවතින ගැටලු

- බදු අයකිරීම් වැනි නීතිමය සීමා

- විද්‍යුත් ක්‍රම පිළිබඳ ව විශ්වාසය නො මැතිකම

- පරිගණක පද්ධති ආශ්‍රිත ව වංචා හා දූෂණ සිදු වීම

ClassWork.LK

විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර

B2B - ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට

ව්‍යාපාරයක් තවත් ව්‍යාපාරයක් සමග සිදු කරන ගනුදෙනු වේ.

නිදසුන් :

ව්‍යාපාරයකින් ව්‍යාපාරයකට අන්තර්ජාලය හරහා ඇණවුම් ලැබීම

B2C - ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට

ව්‍යාපාරයක් යම් භාණ්ඩයක් හෝ සේවාවක් අන්තර්ජාලය හරහා පාරිභෝගිකයින්ට අලෙවි කිරීම. මෙය විද්‍යුත් සිල්ලර වෙළෙඳාම E-tailing ලෙස ද හැඳින්වේ.

C2C-පාරිභෝගිකයාගෙන් පාරිභෝගිකයාට

යම් පාරිභෝගිකයෙකු විසින් තවත් පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා අන්තර්ජාලය හරහා අලෙවි කිරීමයි.

නිදසුන් : ebay වෙබ් අඩවිය හරහා සිදු වන ගනුදෙනු

ClassWork.LK

G2C - රජයෙන් පුරවැසියන්ට

රාජ්‍ය සේවා සඳහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා ලබා ගැනීම යි.

නිදසුන් :

බස්නාහිර පළාතේ ජනතාවට තම වාහන බලපත්‍ර අලුත් කර ගැනීම www.motortraffic.wp.gov.lk වෙබ් අඩවිය හරහා සිදු කළ හැකි වීම

B2G - ව්‍යාපාරිකයාගෙන් රජයට

ව්‍යාපාරිකයින් විසින් රජයට අන්තර්ජාලය හරහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා සැපයීමයි.

නිදසුන් :

සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් කිරීම

ClassWork.LK

G2B - රජයෙන් ව්‍යාපාරිකයාට

නිදසුන් :

අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)

C2G - පුරවැසියන්ගෙන් රජයට

නිදසුන් :

බිල්පත්, විභාග ගාස්තු, බලපත්‍ර ගාස්තු ආදිය ගෙවීම විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීම

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura